# ලංකා බැංකුව

ලොව ඉහළ පෙළේ බැංකු 1000 අතරට සහ ආසියා පැසිෆික් කලාපයේ ඉහළ පෙළේ විශාලතම බැංකු 500 අතරට ශ්‍රේණිගත වී ඇති ශ්‍රී ලංකාවේ රජයට අයත් අග්‍රගණ්‍ය අංක 1 වාණිජ බැංකුව වන ලංකා බැංකුව පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් හා පළපුරුද්ද සහිත පුද්ගලයකු අපේක්ෂා කරයි.

## භාෂා පරිවර්තක තනතුර (සිංහල / ඉංග්‍රීසි)

### ● මූලික වගකීම්

මෙම තනතුරෙහි මූලික වගකීම්වලට පහත සඳහන් දෑ ඇතුළත් වන අතර, එහෙත් ඒවා පමණක් සීමා නොවේ.

- ✓ බැංකුවේ නිල ලේඛන සිංහල භාෂාවෙන් ඉංග්‍රීසියට සහ ඉංග්‍රීසි භාෂාවෙන් සිංහලට පරිවර්තනය කිරීම.
- ✓ මුල් පිටපත්වල අදහසම පරිවර්තිත ලේඛන මඟින් සන්නිවේදනය වන බවට වගබලා ගැනීම.
- ✓ ව්‍යාකරණ, අක්ෂර වින්‍යාසය හා විරාම ලකුණු ආදියෙහි දෝෂ නැති කරගැනීම සඳහා පරිවර්තිත ලේඛන සෝදුපත් බැලීම.
- ✓ අනෙකුත් අභ්‍යන්තර දෙපාර්තමේන්තු සහ පළාත් සමග මිත්‍රශීලී සම්බන්ධතාවයක් පවත්වා ගැනීම.

### ● යෝග්‍යතා නිර්ණායක

- ➢ **ශ්‍රී ලාංකිය පුරවැසියකු විය යුතුය**

**සහ**

- ➢ **අධ්‍යාපන / වෘත්තිය සුදුසුකම්**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ) සිංහල භාෂාව විෂයයක් ලෙස ඇතුළත්ව ලබාගත් උපාධියක් සහ අ.පො.ස (සා. පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් හෝ අ.පො.ස (උ.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ) ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස ඇතුළත්ව ලබාගත් උපාධියක් සහ අ.පො.ස (සා. පෙළ) විභාගයේදී සිංහල භාෂාවට සම්මාන සාමාර්ථයක් හෝ අ.පො.ස (උ. පෙළ) විභාගයේදී සිංහල භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

- ❖ භාෂා පරිවර්තන ඩිප්ලෝමාවක් හෝ වෙනත් යම් වෘත්තීමය සුදුසුකමක් (උදා: දිවුරුම් දුන් භාෂා පරිවර්තක) නිශ්චිතවම වාසිදායක වනු ඇත.

- ➢ **පළපුරුද්ද**

රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය ආයතනයක, බැංකුවක හෝ කිසියම් පිළිගත් වාණිජ ආයතනයක සිංහල/ ඉංග්‍රීසි සහ ඉංග්‍රීසි / සිංහල භාෂා පරිවර්තකයෙකු ලෙස අවම වශයෙන් වසර 3 ක පළපුරුද්දක් තිබීම.

- ➢ **වෙනත් සුදුසුකම්**
  - ✓ සිංහල / දෙමළ සහ දෙමළ/ සිංහල පරිවර්තන හැකියාව අමතර සුදුසුකමක් වේ.
  - ✓ පරිගණක සාක්ෂරතාවය සහ සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරු ලේඛනය කිරීමේ හැකියාව.
  - ✓ අසීරු කාලසීමාවන් යටතේ කාර්ය නිම කිරීමේ හැකියාව.
  - ✓ පරිවර්තන ක්‍රියාවලිය, වාග් කෝෂය හා දේශීයකරණ ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම.
  - ✓ පරිවර්තනයේ ගුණාත්මක බව පරීක්ෂා කිරීමට විශේෂිත ශබ්දකෝෂ හා පරිවර්තන මෙවලම් භාවිතා කිරීමේ පළපුරුදු බව.

- ➢ **වයස**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 හෝ ඊට අඩු විය යුතුය.

### ● වැටුප් පරිමාණය

මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය වන්නේ

රු. 62,060/= රු. 81,660/=
රු. 980/= X – 20

(වෙනස් වන සුළු ජීවන වියදම් දීමනාව සමග ආරම්භක දළ වැටුප මසකට රු. 150,000/= පමණ වේ.)

### ● පොදු නියමයන් සහ කොන්දේසි

- ✓ මෙම තනතුර බැංකු සේවයෙහි සාමාන්‍ය නියමයන් හා කොන්දේසිවලට යටත් වන නමුදු සාමාන්‍ය බැංකු සේවයට පරිබාහිර (සංවෘත සේවය) වේ.
- ✓ පරිවාස කාලය වසර දෙකක් (02) වන අතර, පරිවාස කාලසීමාව තුළ බැංකුව සෑහීමට පත්වන ආකාරයට අවශ්‍යතා සපුරාලීම මත පරිවර්තක -I (සිංහල/ ඉංග්‍රීසි) ලෙස බැංකු සේවයෙහි ස්ථිර කරනු ලැබේ.
- ✓ කාර්යාල වේලාවෙන් පසුව, සති අන්ත/ නිවාඩු දිනවල සේවය කිරීම අපේක්ෂා කෙරේ.

### ● තෝරා ගැනීමේ පටිපාටිය

තරග විභාගයකින් අනතුරුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරාගනු ලැබේ.

### ● අයදුම් කිරීමේ පටිපාටිය

ඔබගේ යාවත්කාලීන කරන ලද ජීව දත්ත පත, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, අධ්‍යාපන/ වෘත්තිය සුදුසුකම්වලට අදාළ සහතික සහ පළපුරුද්ද සනාථ කිරීමට අවශ්‍ය ලේඛන යනාදියෙහි ඡායාස්ථ පිටපත් සමග ඔබ පිළිබඳව විස්තර ලබාගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ ඇමතුම් විස්තර ද ඇතුළත් කර 2023 මැයි මස 13 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු අතර, අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කළ තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත යෝග්‍යතා නිර්ණායක සපුරා නැති හෝ අදාළ සනාථ කිරීමේ ලේඛනවල ඡායාස්ථ පිටපත් නොමැතිව හෝ සාවද්‍ය තොරතුරු සහිතව යොමු කළ ඕනෑම අයදුම්පතක් කිසිදු දැන්වීමකින් තොරව බඳවා ගැනීමේ ඕනෑම අදියරකදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන කළමනාකරු (බඳවා ගැනීම් සහ වෘත්තීය සංවර්ධන)**
**මානව සම්පත් අංශය,**
**26 වන මහල, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල,**
**ලංකා බැංකු චතුරස්‍රය,**
**අංක 01, ලංකා බැංකු මාවත,**
**කොළඹ 01.**

- ● කිසිදු අයුරකින් හෝ බලපෑම් කිරීම වහාම නුසුදුසුභාවයට පත් කිරීමට හේතු වේ.
- ● තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.
- ● සම්පූර්ණ කළයුතු තනතුරු සංඛ්‍යාව තීරණය කිරීමේ හෝ බඳවා ගැනීම කල් දැමීමේ අයිතිය බැංකුව සතුය.

1975 BOC
www.boc.lk
ප්‍රධාන කාර්යාලය, BOC චතුරස්‍රය, අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.
ලංකා බැංකුව BOC